# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/34 – 2017 ජුනි 21 වැනි බදාදා – 2017.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළේ සුළු කොට්ඨාසයේ, අඹකුඹුර ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක කේඊ/ඩබ්ලිව්ආර්කේ/2016/204 හා 2016.08.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.0951ක් වන අක්ෂර 'A' වශයෙන් දක්වා ඇති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – ඔරේන්ජ්ග්‍රෝව් වතුයායේ කණුකැටිය කොටස – ප්‍රමාණය: හෙක්. 1.0951

උතුරට: පළාත් සභා මාර්ගය සහ උණපඳුරගාව හේන; නැගෙනහිරට: උණපඳුරගාව හේන, අඹගහමුල හේන වත්ත, මාර්ගය සහ අඹගහමුලහේන වත්ත; දකුණට: අඹගහමුලහේන වත්ත, ඔරේන්ජ්ග්‍රෝව් වතුයායේ කණුකැටිය කොටස සහ කණුකැටිය; බටහිරට: කණුකැටිය සහ පළාත් සභා මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2016/VE/235.
2017 අප්‍රේල් මස 19 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 128

1A – G25772 – 12 (2017/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.